# දිගාමඩුලු වෙරලබඩ කලාපයට පොදු ලකුණක් වූ ජන ගී සම්ප්‍රදාය

හල්පිටියේ සමිතසිරි හිමි[1]

## හැඳින්වීම

අතීතයේ සිටම දිගාමඩුල්ල වෙරළබඩ පානම්පත්තුව පානම ආශ්‍රිතව ජීවත්වූ සිංහල, දෙමළ සහ මුස්ලිම් ජනතාව ඉතා සුහදශීලීව දිවි ගෙවූ බවට සාධක බොහෝ සෙයින් සොයා සපයා ගත හැකිය. මේ හේතුවෙන් ඔවුනොවුන් කථා කළ භාෂාව, අදහන ලද හෝ විශ්වාස කරන ලද ආගම, පිළිපදින ලද සිරිත් විරිත් වැනි සංස්කෘතිකාංග සම්මිශ්‍රණය වීමෙන් ජාති, ආගම්, වර්ග භේදයකින් තොරව ඒකාත්මිකව දිවි ගෙවූ බව දැකගත හැකිය. ඒ අනුව සෑම සමාජ කණ්ඩායමකටම පොදු වූ යම් යම් සංස්කෘතික ලක්‍ෂණ විද්‍යාමාන වන අතර පුරා තිස් වසරක් පැවති බිහිසුණු වර්ගවාදී යුද්ධය හමුවේ වුවද ඒවා අද දක්වා නොනැසී පවතියි. මෙසේ මෙකී සමාජයට ආවේණිකව මේ දක්වාම සුරක්‍ෂිතව පවතින සංස්කෘතිකාංග අතර මෙම ප්‍රදේශයෙහි ව්‍යවහාරවන ජන ගී සම්ප්‍රදාය හඳුනාගත හැකිය. මෙසේ දිගාමඩුලු වෙරළබඩ කළාපයට පොදු ලකුණක් වූ ජන ගී සම්ප්‍රදාය පිළිබඳව සොයා බැලීම මෙම පර්යේෂණයේ අරමුණයි.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනය අම්පාර දිස්ත්‍රික්කයේ (දිගාමඩුල්ල) පානම ප්‍රදේශය ආශ්‍රිතව සිදු කරන ලද අතර දත්ත රැස් කිරීම සඳහා සරල සසම්භාවී නියැදීම් ක්‍රමය ඔස්සේ අධ්‍යයනයට අදාළ නියැදිය සකස් කර ගන්නා ලදි. ඒ අනුව දත්ත රැස් කිරීමේදී ප්‍රාථමික, ද්විතීයික දත්ත යොදා ගත් අතර ප්‍රාථමික දත්ත රැස් කිරීම සඳහා ප්‍රශ්නාවලිය, නිරීක්‍ෂණ හා සම්මුඛ සාකච්ඡා යොදා ගන්නා ලදි. අධ්‍යයන ප්‍රදේශය අම්පාර දිස්ත්‍රික්කයේ වෙරබඩ කළාපයට අයත් පානම්පත්තුව පානම ප්‍රදේශය යොදා ගන්නා ලදි. විශේෂයෙන් මෙම ප්‍රදේශය වියලි කළාපයට අයත් වන අතර බහුතරය කෘෂිකර්මාන්තය මුල් කරගත් ප්‍රජාවක් දක්නට ලැබේ. බහු ජාතික හා බහු ආගමික සමාජයකි. ග්‍රාමීය ලක්‍ෂණ ශේෂව පවතින අර්ධ නාගරික ප්‍රදේශයක්ද වේ.

## සොයාගැනීම් සහ නිගමනයන්

දිගාමඩුලු වෙරබඩ කලාපයේ සිංහල ගැමියන් අසල්වැසි අසිංහලයන් සමඟ ඈත අතීතයේ දි සහජීවනයෙන් වාසය කළබව එහි සුභාවිත ජනකවිය විමසා

[1] දෙමළ භාෂා උපදේශක, භාෂා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය

බැලීමේදී ප්‍රකට වේ. එමෙන්ම ඔවුනොවුන් අතර අවාහ විවාහ කටයුතු සිදුවීමද එදා මෙන්ම අදද දැකිය හැකිය. සිංහල අසිංහල මිශ්‍ර විවාහයන් මෙම කලාපයේ ගැමියනට අරුමයක් නොවේ. වර්තමානයේ මෙම කලාපය රුදුරු යුද්ධයකට ගොදුරු වි තිබුණද එහි ගැමියන්ගේ සහජීවනයට දැඩි බලපෑමක් එල්ල කර ඇති බවක් නම් නොපෙනෙයි.

මෙම ගැමියන්ගේ සහජීවනයේ තරම කියාපාන අපූරු ජනකවි අපමණය. ඒ අතර තම දරුවන් නැලවීමට සිංහල මව්වරුන් ගායනා කරන දෙමළ බස මුසුවූ නැළවිලි ගී ද දැකිය හැකිය. සිංහල මවක් තම දරුවා දෙමළ නැළවිලි ගීයකින් සතපවන්න තරම් ඇගේ සිත පටු වාදභේද වලින් කිළිටි නොවි පොදු මානව දයාවෙන් පිරී තිබීම එහි ගැමියන් ගේ සහජීවනයට කදිම නිදසුනකි. එවන් නැළවිලි ගීයක් පහත දැක්වේ.

''පොන්නත්තා කළු පොන්නත්තා
පොන්නී නම් මඩ කිලික්කියනා
දෑතා ඩිංගිරි පොන්නත්තා
පොන්නත්තා කළු පොන්නත්තා''

'' කයි වීසි අම්මා කයි වීසී
කේක්කිය නම්මඩ කයි වීසී
කඩක්කි පෝංග කයි වීසී
මුට්ටායි වාංග කයි වීසී''

දෙමළ බසින් නම්මඩ යන්න ''අපේ '' යන අරුත දෙන අතර කිලික්කිය යනු ''සිලිබිල්ලා'' හෙවත් පන්තේරුව වැනි සෙල්ලම් භාණ්ඩයකි.

කයි යනු ''අත'' යන්න පැවසෙන අතර වීසී යන්න විසිකරන්න, පද්දන්න යන අරුත් දෙයි. තොටිල්ලේ නැළවෙන තම සිඟිති දරුවා හට කඩේට දිවගොස් සීනිබෝල රැගෙන එන ලෙස මව මෙම නැළවිලි ගීයෙන් පවසන්නීය.

කේක්කිය යනු ''අසන්න'' යැයි අදහස් වන අතර කඩක්කි පෝංග යනු '' කඩේට යන්න'' යැයි පැවසෙයි. සීනිබෝල රැගෙන එන්න යයි පවසන්නේ මුට්ටායි වාංග යනුවෙනි.

පටු ජාති භේදයෙන් ළමා මනස විකෘති නොකර තොටිල්ලේ නැළවෙන දරුවාගේ දෙසවනින් මනසට රැගෙන යන්නේ අන්‍ය බසක මිහිරයි. දයාව හා

ආදරයයි. මෙවන් නැළවිලි ගීයකින් නිදි සුවය විඳින දරුවා මතු සමාජයේ මානව දයාවෙන් පිරිපුන් වූ මිනිසෙකුම වේ.

මෙවැනි දරුවන් යොවුන් වියට එළැඹි කල දෙමළ ආදි අන්‍ය ජාතික අසල්වැසියන් සමඟ පෙමින් වෙළීම අරුමයක් නම් නොවේ. එයින් නොනැවතී ඔවුනොවුන් අතර සිදුවන විවාහයන් ද අපමණය.

දිගාමඩුලු ප්‍රදේශයේ ජනකවි අතර දක්නට ලැබෙන පෙම් කවිද මෙයට කදිම නිදසුනක් සපයයි. පහත දැක්වෙන්නේ එවැනි කවියකි.

"තලයුම් තල මුඩියුම් කිතුලක මල සේමා
උඩයුම් නඩයුම් රණ ගිරවිගෙ තුඩ සේමා
ඉරවුම් පහලුම් නිදි නැත මගෙ පුරුදූ ළමා
නීයුම් නානුම් එක යහනක ඉදිමු ළමා"

තලයුම් තලමුඩියුම් යන හිස හා කේශ කලාපයයි. එය කිතුලක මලට උපමා කරන කවියා ඇගේ ඇඳුම හා ගමන රණ ගිරවියකට උපමා කරයි. ඇය ඇඳ සිටින ඇඳුම රක්ත වර්ණයෙන් යුක්තය. එය ගිරවියෙකුගේ තුඩ මෙන් ලේ රතු පැහැයක් ගනී. ඉරවුම් රැයෙහිද, පහලුම් දහවලෙහිද කිසිදු වෙනසක් නොමැතිව සිය සිත තුළ ඇය පිළිබඳ හැඟීම් වියැකී නොයයි. ඒ ගැන "නිදි නැති මගෙ පුරුදූළමා" යනුවෙන් කවියා පවසයි. එනිසා නීයුම් නානුම් ඔබත් මමත් " එක යහනක ඉදිමු" යනුවෙන් එක පැලක් තුළ ජීවත්වීමට ඇයට ආරාධනා කරයි."

මෙම සිංහල තරුණයා මෙසේ රුව වණමින් එක පැලක් තුළ මම හා එක්ව ජීවත්වීමට ආරාධනා කරන්නේ දෙමළ තරුණියකටය. ඇගේ රුව ගුණ දැකීමට ද ඇය කෙරෙහි පෙම් සිතිවිලි පහළ වී තමන් හා එක්ව ජීවත්වීමට ඇයට ආරාධනා කිරීමටද ඇගේ දෙමළ බව ඔහුට බාධාවක් වී නොමැත. එවැනි පටු සීමා බාධක අතික්‍රමණය කරමින් ඔහුගේ සිත පොදු මානව ගුණයෙන් පිරීගොස් ඇත.

එමෙන්ම " දෙමළ කාන්තාවකට පෙම් බැඳි " පෙර සඳහන් ගැමි තරුණයා හට බස පිළිබඳ ගැටලුවක් නොවීය. එහෙත් තමන් දෙමළ බස නොදැන සිටියද එය බාධාවක් සේ නොසැලකූ සිංහල තරුණයෙකු දෙමළ තරුණියක හා පෙමෙන් බැඳුන අයුරු පහත දැක්වෙන ජන කවියෙන් පැහැදිලි වේ.

" දෙමළ ලියේ නුඹෙ බාසේ නොබාසේ
ගින්දර වැන්න නුඹ අඳිනා සරාසේ
රත්තරනට පිත්තල එක් වුණාසේ
දෙනවදළඳේ දිය බොන්නට පිපාසේ"

දෙමළ තරුණියකට පෙම් කරන සිංහල තරුණයාට දෙමළ බස නොතේරෙයි. මෙහිදි ආදරය උදෙසා බස පමණක් නොව කුමන සාධකයක් හෝ බාධකයක් නොවන බව කියවෙන පණිවුඩය කවියා අපට කියයි. ඇගේ ඇඳුම පැළඳුම ගුණ වර්ණනා කරන ඔහු ' දෙනවද ළඳේ දිය බොන්නට පිපාසේ ' යනුවෙන් ව්‍යංගාර්ථයෙන් තම පෙම් සිතිවිලි ඇයට පළ කරයි.
බස පමණක් නොව ඇය පැමිණියේ කොහි සිට දැයි නොදත් දෙමළ තරුණියට පෙම් බඳින සිංහල තරුණයෙකු ද අපට දිගාමඩුලු ජනකවි තුලින් හමුවේ.

"කයිල වත්තියෙන් ආ දැයි දෙමළ පැටී
ඉනෙන් බඩෙන් කොණ්ඩෙන් ලස්සයක් වටී
ඉනට රෙද්ද ඇතුවා නම් රටක් වටී
දෙවියෝ රැක දියං මා දුටු දෙමළ පැටී"

දෙමළ තරුණිය පැමිණියේ කෙහෙ සිට දැයි තරුණයා නිශ්චිතවම නොදනී. ඇය පැමිණියේ කයිල වත්තියෙන් දැයි ඔහුට සැක සිතෙයි. තරුණියගේ රූ සපුව තරුණයාගේ නෙත් සිත පැහැර ගනී. ඇය ඉන වටේ සේලයක් ඇඳ සිටියේ නම් තවත් හැඩ වන්නේ යැයි ඔහුට සිතෙයි. මෙම දෙමළ තරුණිය කෙරෙහි පෙම් සිතිවිලි පහළ වූ සිංහල තරුණයා ඇය රැකදෙන ලෙස දෙවියන්ගෙන් අයැද සිටියි.

දෙමළ තරුණියන් හට පමණක් නොව මුස්ලිම් තරුණියන් හටද සිංහල තරුණයන් පෙම්කළ බව එහි ජනකවි විමසා බැලීමේදි දැකිය හැකිය.

ලියනරාල නම් ජනකවියා ගැන කියවෙන කතා පුවත මෙහිදි ගෙනහැර දැක්විය හැකිය.

ඈත අතීතයේ දිගාමඩුලු පානම්පත්තුවේපානම ගමේ උපන් ලියනරාල කවියා එහි ම ජීවත් වූ ගැමියෙකි. යෝනක කතකට ඔහු බැඳි පෙම් කවි පිළිබඳ කථා පුවත පානම්පත්තුවේ ජනකවියේ එන ඔහුගේ කවි මෙන්ම රසවත්ය.

එනම් ලියනරාල කවියා තරුණ වියේදි එකල පොතුවිල් කඩමණ්ඩිය අසල පිහිටි බෝරුක් සෙවණෙක දිනක් මොහොතක් රැඳි සිටියේය. මහ මග යන

බොහෝ දෙනෙකු නිතර ගිමන් හරින මෙම තුරු සෙවණ යට මුස්ලිම් පියෙකු හා ඔහුගේ තරුණ දියණියක ද රැඳී සිටිනු කවියාගේ නෙත ගැටී ඇත. මෙම රූමත් තරුණිය කෙරෙහි කවියාගේ සිත ඇදී ගියේය. ඔහු තරුණියගේ නෙත් දෙස බලාගත්වනම මෙම කවි පෙළ හිටිවනම ගායනා කළේය. එවිට ඇගේ සියොලඟෙහි එක පැහැර හිරිගඩු මතු වූ අතර ඔහු කවි පෙළ ගායනා කර අවසන් වුවද එය මැකී නොගියේය.

තම දියණියගේ ගත පුරා බිබිලි මතු වූයේ යැයි සිතූ පියා කෝපයට පත්වී මෙසේ කීවේලු.

"මේ සිංහල මිනිහා මගේ දුවට හූනියම් කෙරුවා උඹව අරන් පලයං"

"එයින් පසු ලියනරාල කවියා එදාම ඈ කැටුව පානමට ආ බවත් මහලු වයසට පැමිණ මියයන තෙක්ම ඔවුන් ඉතා සතුටින් කල් ගෙවූ බවත් පැවසේ."

ලියනරාල කවියා එම යෝනක කතට බැඳි පෙළේ එන එක් කවියක් පහත දැක්වේ.

"සිහිනිගලු රන් දුණු මිටලු කළ
වායා ගෑ රන් රඹ පැළලු
දෙපතුල ලූ සකි සුනිපුල ලු
දස ගිලි බැබලු රන් පලු සරිලු
කෙව්ලිය ලූ හඬ නද කිඳුරු
මා දැක තෙපලු මුව රළ මුකුලු
මල් මද ලූ සුරඟන වටිලූ සකි
යොන් කතලු පොතුවිල සිටිලු"

ලියනරාල කවියා දුටු යොන් කතගේ සිහිනිඟ රන් දුණු මිටක් වැනිය. ඇගේ දෙපාවල දසඟිලි බැබලෙන්නේ නීල මාණික්‍යයක් මෙනි. දෙපතුල් රන්පළු සෙයකි. ඇගේ කටහඬ කෙවිලියකගේ මෙන් මිහිරිය. ඇගේ මුකුලු සිනහව කිඳුරියකගේ මෙන් ය. තමන් පොතුවිල් දුටු මෙම යොන් කත සුරංගනාවියක් වැනි යයි ලියනරාල කවියා පවසයි.

තමන් දුටු සුරඟනක් මෙන් වූ යොන් කත ගැන කවියා මෙසේ පවසයි.

" මෙසුරඟනා දුටුයුග නෙතිනා එන
කඳුලු තනා තුන් යම ඉදිනා
මිතුරු දෙනා සැමදෙන විසිනා ළඳ
සරණ ගෙනා ලැබුණොත් මෙදිනා
දහසකිනා මිණි බරණ තනා
කර පළඳමිනා ඇගේ සිතු ලෙසිනා
රට වටිනා රන්මාල තනා
රන් දහසකිනා රන් එල්ලමිනා"

මෙම සුරංගනාවියක් වැනි යෝනක කාන්තාව දුටු තම නෙත් දෙකින් දිවා රැයේ කඳුළු වගුරුවමින් සිටීමට තමන්ට සිදුවන බව කවියා පවසයි. සියලු නෑදෑ හිතමිතුරන්ගේ ආශිර්වාද ලැබ ඇය සරණ පාවා ගැනීමට ලැබුණොත් ඔහු ඇගේ ගත රටක් වටිනා රන් මැණික් ආදියෙන් තැනූ ආභරණයන්ගෙන් සරසන්නේ යැයි පවසයි.

අවසානයේ ලියනරාල කවියා තම නෙත් සිත් පැහැරගත් සුරඟනක් වන් යෝනක කත පවසන්නේ සුපුරුදු පෙම්වතුන් මෙන් තමන් ද තෑගි බෝග පිරිනමන බවයි. අද මෙන්ම එදා ද නගරයේ පමණක් නොව ගැමි පෙම්වතුන් ද තම පෙම්වතිය හට තෑගි බෝග පිරිනැමූ බව මෙයින් පසක් වේ.

"ළඳුනේ වරලස පීරා බඳිනට
දෙඤ්ඤයි කැඩපත් ගෙන්නාලා
ළඳුනේ පියයුර නෙත ලා බැලුමට
දෙඤ්ඤයි රන්පටි ගෙන්නාලා
ළඳුනේ තුනු ඉඟ නෙත ලා බැඳුමට
දෙඤ්ඤයි ඔළියල් ගෙන්නාලා
ළඳුනේ කළු ළඳ මා වෙත සිටියට
දෙඤ්ඤයි සන්නස් ගෙන්නාලා"

ඇගේ කේශ කලාපය අංකාර ලෙස පීරා බැඳීමට නම් එය ඇයටම දැක ගැනීමට කැඩපතක් අවශ්‍ය බව දන්නා කවියා කැඩපතක් ගෙන්නා දෙන බව පවසයි. කාන්තාවන්ගේ පුන් පියයුරු පිරිමින්ගේ නෙත් සිත් පැහැර ගන්නා නිසාම නොව ඒවා රැක ගැනීමට කාන්තාව සැලකිලිමත් වේ. ඒවා රැක ගැනීමට බඳින

තන පට හෙවත් රන්පට දෙන්නට ඔහු පොරොන්දු වේ. එපමණක් නොව සිහින් ඉඟට ගැලපෙන ඔලියල් හෙවත් කසී සළු තෑගි දෙන පවසයි.

දෙමළ හා මුස්ලිම් පමණක් නොව ජාවා ජාතිකයන් සමඟ ද ප්‍රේම සම්බන්ධතා ගොඩනගා ගත් බව මෙහි ජනකවි විමසා බැලීමේදී දැකිය හැකිය. පහත දැක්වෙන්නේ එවැනි කවියකි.

''හම්බන්තොට ඉඳලා ආ ජාවාට
ඇයි වේසි කල් බැන්දේ ඕකාට
මුදල වැඩි නිසා කල් බැන්දේ ඕකාට
පල වේසි සෙයියා දූවා එක්ක රටින් රට''

සෙයියාදූ නම් දිළිඳු මුස්ලිම් තරුණයෙකු සමඟ පෙමින් බැඳි සිටි සිංහල තරුණියක් ඔහු අමතක කර වත් පොහොසත් කමින් යුත් ජා තරුණයෙකු සමඟ පෙම් සබඳතාවක් ගොඩනගා ගත් අයුරු මෙම කවියෙන් කියවේ.

ජා තරුණයා පැමිණියේ හම්බන්තොට සිටය. මොහු සමඟ තම දියණිය පෙම් සබඳතාවක් ගොඩ නගා ගැනීම ගැන පියා උරණ වේ. '' ඇයි වේසි කල් බැන්දේ ඕකාට '' යනුවෙන් ඔහු පවසන්නේ කෝපයෙනි. මන්ද තම දියණියට ''වේසි'' යනුවෙන්ද ජා තරුණයාට ''ඕකා'' යනුවෙන් ද පවසන්නේ එබැවිනි. එම වදන් ගැමි වහරේ නින්දා සහගත වදන්ය. පියා මෙසේ කෝප වන්නේ ඇගේ දිළිඳු මුස්ලිම් පෙම්වතා වන සෙයියාදූ නම් තරුණයා අමතක කර පොහොසත් ජා තරුණයෙකු සමඟ පෙම් සබඳතාව ගොඩනගා ගැනීම නිසාය.

පෙම්වතෙකු අමතක කර තවත් පෙම්වතෙකු සමඟ සබඳතා ඇතිකර ගැනීම ගැමි සමාජයේ අවමානයට, නින්දාවට පත්වීමට හේතු වේ. තම දියණියට පෙර පෙම්වතා වූ මුස්ලිම් තරුණයා සමඟ දීග යන ලෙස පියා පවසන්නේ එබැවිනි. එහෙත් පොහොසත් ජා තරුණයා ඇගේ දිළිඳු පෙම්වතාට හා ඇයට වින කරයිද යන සැකය පියාගේ සිතට නැගෙනවා විය හැකිය. '' පල වේසි සෙයියාදූවා එක්ක රටින් රට'' යැයි ඔහු ඇයට සෙයියාදූ සමඟ වෙනත් ප්‍රදේශයකට පළා යන ලෙස පවසන්නේ එබැවිනි. එමෙන්ම පිටස්තර ජා තරුණයාට නොව තම අසල්වැසි මුස්ලිම් තරුණයාට ඇගේ පියා මහත් සේ මනාප බව මෙයින් පැහැදිලිය.

මෙසේ අන්‍ය ජාතිකයන් සමඟ පෙම් සබඳතා ගොඩනගා ගත් තරුණ තරුණියන් පමණක් නොව විවාහ ජීවිතයක් ගෙවන වැඩිහිටියන් ද තම අසල්වැසි

අන්‍ය ජාතික ගැමියන් සමඟ සහජීවනයෙන් කල් ගෙවා ඇත. තම නිවසට පැමිණෙන දෙමළ ජාතික අමුත්තා පිළිගැනීමට යුහු සුළු වන සිංහල පියෙකු හා දියණියක පිළිබඳ කියවෙන අපූරු ජන ගීයක් එහි ජනකවි අතර දක්නට ලැබේ.

'' උස් පිළ පිට කුකුලු රාළ පායි කොණ්ඩුවා
පායි කොණ්ඩුවා මහලේ පායි කොණ්ඩුවා
සෙම්බුවකට වතුර දමා තණ්ණි කොණ්ඩුවා
තණ්ණි කොණ්ඩු වා මහලේ තණ්ණි කොණ්ඩුවා

පිඟානකට බත් බෙදලා සෝරු කොණ්ඩුවා
සෝරු කොණ්ඩු වා මහලේ සෝරු කොණ්ඩුවා
කුල්ලකට නෙල්ලි දමා සුලහු කොණ්ඩුවා
සුලහු කොණ්ඩු වා මහලේ සුලහු කොණ්ඩුවා''

පායි යනු පැදුරය. යමක් රැගෙන එන ලෙස පවසන්නේ කොණ්ඩුවා යනුවෙනි. පියා තම දියණියට (මහලේ) පවසන්නේ අසිංහල අමුත්තා වන කුකුලුරාළ නිවසට පැමිණ සිටින බැවින් උස් පිළ පිට පැදුර එළා ඔහුට අසුන් පනවන ලෙසයි. නිවසට පැමිණෙන ගෞරවනීය අමුත්තන් සඳහා ගැමි ගෙදර අසුන් පැනවෙන්නේ උස් පිළ මතය. එහෙයින් මෙම අසිංහල අමුත්තා හට ගරු සරු පෙරටුව අසුන් පනවන ලෙස පියා තම දියණියට පවසයි.

තම අමුත්තා හට ආහාරපාන වලින් සංග්‍රහ කිරීමට ඔවුහු සූදානම් වෙති. වතුර සෙම්බුවක් රැගෙනවිත් අමුත්තාට ඒ සඳහා ආරාධනා කරන ලෙස පියා දියණියට පවසයි. 'තණ්ණි' යනු වතුරය. ගැමිගෙදර දිය බීම සඳහා පොල් කටුවක් වැනි යමක් භාවිත කිරීම සාමාන්‍ය සිරිතය. ඒ සඳහා විශේෂයෙන් පිළියෙල කළ පොල්කටු ද දැකිය හැකිය. එහෙත් දිය බීමට සෙම්බුවක් භාවිත කරන්නේ ගරු කටයුතු අමුත්තන් උදෙසාය. ඉන් උපරිම ආගන්තුක සත්කාරයක් විද්‍යමාන වේ. පැන් පිළිගැන්වීමෙන් පසු පිඟානකට බත් බෙදා රැගෙනවිත් පිළිගන්වන ලෙස පියා දියණියට උපදෙස් දෙයි. එසේ ආහාර පිළියෙල කිරීමට සහල් නොමැති නම් විගස වී කොටා සහල් කර බත පිසින ලෙස ද ඔහු දියණියට පවසන්නේ ''කුල්ලකට නෙල්ලි දමා සුලහු කොන්ඩුවා'' යනුවෙනි. නෙල්ලි යනු ''වී'' වන අතර කුල්ල සුලහු නම් වේ.

දිගාමඩුලු වෙරළබඩ කලාපයේ සිංහල දෙමළ යෝනක සබඳතා එළිදැක්වෙන මෙවැනි තවත් ජනකවි මෙහි ජනකවි අතර නැත්තේ නොවේ. මෙහි

ගැමියා පටු බේද ඉවතලා පොදු මානව හැඟීමෙන් දිවි ගෙවූ බව මෙයින් අපට ප්‍රකට වේ.

මේ අනුව අතීතයේ සිටම දිගාමඩුලු වෙරළබඩ කළාපය ආශ්‍රිතව ජීවත්වූ සිංහල, දෙමළ හා මුස්ලිම් ජනතාව පටු වාද භේද ඉවතලා සමගි සම්පන්නව සහජීවනයෙන් දිවි ගෙවූ බව එම ප්‍රදේශයේ සෑම ජන කණ්ඩායමකටම පොදු ලකුණක් වූ ජන ගී සම්ප්‍රදාය ඇසුරෙන් නිගමනය කළ හැකි අතර වර්තමානයේ අභියෝගයක්ව පවතින ජාතීන් අතර සංහිඳියාව ගොඩ නැගීමේ ක්‍රියාවලියේ එක්තරා පැතිකඩක් ලෙසද එකී සමාජය තුළ දක්නට ලැබෙන ඉහත කී පොදු ලක්ෂණ පාදක කරගත හැකි බව නිගමනය කිරීමට හැකිය.

දත්ත දායකයෝ

කන්දසාමි, පාලසුන්දරම්, පොලිස් ස්ථානය අසල, වැටියවෙල, පොතුවිල්, අවු.55 යි, පුරුෂ, හින්දු. විවාහක, සිව්දරු, ග්‍රාම නිලධාරී, සිංහල හා ඉංග්‍රිසි කතා කිරීමේහැකියාව. 2016.09.23 වැනි දින.

කිරුපරාජා, පෙරියතම්බි, පානම දකුණ, පානම. අවු.65 යි, පුරුෂ, හින්දු, විවාහක, පස්දරු, ගොවිතැන, සිංහල කතා කිරීමේ හැකියාව. 2016.09.29වැනි දින.

ගෝකුලනායකි, ගනේෂමූර්ති, අංක 32, සාරදා පාර, කාරතීවු. අවු. 47 යි, ස්ත්‍රී, හින්දු, විවාහක, දෙදරු, කළමනාකාර සහකාර, ඉංග්‍රීසි හා සිංහල කතා කිරීමේ හැකියාව 2016.09.30 වැනි දින.

ගනේෂමූර්ති, සෝමසුන්දරම්, නො.45, යාඩි පාර, කල්මුණේ, අවු.47, පුරුෂ, හින්දු, විවිහක, දෙදරු, ගුරු උපදේශක, සිංහල හා ඉංග්‍රීසි භාෂා කතා කිරීමේ හා ලිවීමේ හැකියාව. 2017.02.11 වැනි දින.

පරමේශ්වරී, පෙරියතම්බි, පානම දකුණ, පානම. අවු.54යි, ස්ත්‍රී, හින්දු, විවාහක, පස්දරු, සිංහල භාෂාව කතාකිරීම් හැකියාව. 2017.02.14 වැනි දින.

පද්මාවති, හීන්තිලමේ, පානම මධ්‍යම, පානම. අවු.52යි, ස්ත්‍රී, හින්දු, විවාහක, තිදරු,සිංහල භාෂාව කතාකිරීම් හැකියාව. 2017.04.09 වැනි දින.

බාලචන්ද්‍රන්, කුංජිතතම්බි, පානම දකුණ, පානම. අවු.63යි, පුරුෂ, හින්දු, විවාහක, පස්දරු ව්‍යාපාරික හා ගොවිතැන, සිංහල ලිවීමේහාකතා කිරීමේ හැකියාව. 2017.06.19වැනි දින.

වියාලච්චි, කනපතිපිල්ලේ, ප්‍රාදේශීය ලේකම් කාර්යාල පාර, තිරුක්කෝවිල්. අවු.53යි, ස්ත්‍රී, හින්දු, වැන්දඹු, දෙදරු, පවුල් සෞඛ්‍ය නිළධාරිනී, සිංහල ලිවීමේ හා කතා කිරීමේ හැකියාව. 2017.07.03 වැනි දින.